025

IHRA UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2023/24

ප්‍රථම සෙමෙස්තරය

පවත්වන ලද්දේ නොවැම්බර් 2023

BLM 1131 - නෛතික පරිසරය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

(1) ශ්‍රී ලංකාවේ නීති පද්ධති පූර්ව යටත් විජිත යුගයේ සිට මේ දක්වා කෙලෙස විකාශනය වී ඇති දැයි විමර්ශනය කරන්න.

(ලකුණු 20)

(2) ඉංග්‍රීසි නීති සිද්ධාන්ත ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට හඳුන්වාදී තිබේදැයි අධ්‍යයනය කරන්න.

(ලකුණු 20)

(3) උඩරට නීතියේ මූලාශ්‍ර කවරේදැයි හඳුනාගෙන: උඩරට නීතිය සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම අදාළ වන විශේෂ නීතියක් දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

(4) තේසවලාමේ නීතිය කවර පැනැත්තන් විෂයෙහි අදාළ වන්නේ දැයි විමර්ශනය කරන්න.

(ලකුණු 20)

(5) මුස්ලිම් නීතියේ මූලාශ්‍ර කවරේදැයි හඳුනාගෙන: මුස්ලිම් නීති සිද්ධාන්ත ශ්‍රී ලාංකික පුරවැසියන් විෂයෙහි අදාළ කරගැනීම පිළිබඳව විවාදයට තුඩුදුන් කරුණු නඩු තීන්දු ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 20)

(6) ලන්දේසි පාලන සමයේදී මෙරටට හඳුන්වාදුන් රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ කවර වටිනාකමක් හිමිකරගෙන ඇතිදැයි අධ්‍යයනය කරන්න.

(ලකුණු 20)

(7) ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයට දායකත්වයක් දක්වනු ලබන අධිකරණ, ආයතන සහ පර්ෂද හඳුනාගෙන ඒවායේ අධිකරණ බලයන් පිළිබඳව කරුණු දක්වන්න.

(ලකුණු 20)

****

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2023/24

ප්‍රථම සෙමෙස්තරය

පවත්වන ලද්දේ නොවැම්බර් 2023

BLM 1132 - කළමනාකරණ මූලධර්ම

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

01.

i. කළමනාකරණ මූලධර්ම අධ්‍යනයේදී භාවිතාවන මූලික යෙදුම් (Key Terms) නිර්වචනය කරන්න.

(ලකුණු 10)

ii. කළමනාකරණ කුසලතා සහ භූමිකා නම් කරන්න.

(විස්තර කිරීම් අවශ්‍ය නැත.)

(ලකුණු 05)

iii. සැලසුම්ගත තීරණ සහ සැලසුම්ගත නොවන තීරණ වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. පහත සඳහන් මාතෘකා හතරක් (04) පිලිබඳ සටහන් ලියන්න.

i. සැලසුම්කරණයේ ප්‍රයෝජන
ii. උපායශීලී සැලසුම්කරණ ක්‍රියාවලිය
iii. දැක්ම සහ අරමුණු ප්‍රකාශය (Vision and Mission)
iv. අරමුණු
v. පරිසර විශ්ලේෂණය (SWOT Analysis)
vi. සමස්ත උපායමාර්ග
vii. අභ්‍යන්තර හා බාහිර න්‍යාසය
viii. බී.සී.ජී. න්‍යාසය (BCG Matrix)

(ලකුණු 5x4=20)

03.

i. සංවිධානයක කාර්යයන් දෙපාර්තමේන්තු ගතකිරීමේ පදනම් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. බලතල පැවරීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 05)

iii. බලතල පැවරීමේ බාධක හඳුනාගන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04.

i. නායකත්ව රාමුව (නායකත්ව දැළ/Leadership Grid) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. සංවිධාන නායකයෙකුට බලය ලැබෙන මූලාශ්‍ර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. අනුගාමිකයින් වර්ග හා ඔවුන්ගේ ගති ස්වභාවයන් විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05.

i. අවශ්‍යතා ධූරාවලියේ මට්ටම් පහ රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කර, ඒ ඒ අවශ්‍යතා මට්ටම්වල සාමාන්‍ය අවශ්‍යතා සහ රැකියාවට සම්බන්ධ අවශ්‍යතා වගුවක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ඊ. ආර්. ජී. න්‍යාය ආයතනයක ක්‍රියාත්මක වන ආකාරය රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. අභිප්‍රේරණ න්‍යායන් සංසන්දනය සඳහා වගුවක් (Table) ඉදිරිපත් කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06.

i. කළමනාකරණ පාලනක්‍රම රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. පශ්චාත් පාලනය සිදුවන ආකාරය සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. පශ්චාත් පාලන උපකරණ විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

****

159

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව
භූමි කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2023/24
ප්‍රථම සෙමෙස්තරය

පවත්වන ලද්දේ නොවැම්බර් 2023

BLM 1133 - සංඛ්‍යානය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

01. (අ) පහත දැක්වෙන මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

(i) සන්තතික විචල්‍යය
(ii) විවික්ත විචල්‍යය

(ලකුණු 06)

(ආ) සුදුසු උදාහරණ සපයමින් (උදාහරණ දෙකක් හා අවස්ථා දෙකක්) නියැදි යන්න පැහැදිලි කරන්න

(ලකුණු 06)

(ඇ) තොරතුරු රැස්කිරීමේ (විදි) ආකාර ලියා දක්වන්න

(ලකුණු 04)

(ඈ) "රැස්කරන තොරතුරු අභිනන නොවිය යුතුය." කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

02. (අ) දත්ත සහ තොරතුරු වර්ගීකරණයේ අරමුණු පිළිබඳ කෙටි සටහනක් ලියන්න

(ලකුණු 04)

(ආ) තොරතුරු රැස්කිරීමේදී භූගෝලීය වර්ගීකරණය හා කාලානුක්‍රමික වර්ගීකරණය පිළිබඳ කෙටි සටහනක් ලියන්න

(ලකුණු 06)

(ඇ) තොරතුරු රැස්කිරීමේ දී සංඛ්‍යාත්මක වර්ගීකරණය හා විස්තරාත්මක වර්ගීකරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 06)

(ඈ) තොරතුරු රැස් කිරීමේදී

(i) පරාසය

(ii) පන්ති ප්‍රාන්තර යන ඒවා සුදුසු උදාහරණයක් සපයමින් විස්තර කරන්න.

(ලකුණු 04)

03. පහත දී ඇත්තේ කම්කරුවන් 50 දෙනෙකු විසින් පැයකදී උපයන වේතනයයි.

140	175	187	157	197	108	40	128	203	178
103	133	162	151	79	94	69	42	93	62
130	156	167	124	164	146	116	149	104	141
165	204	195	149	71	113	87	121	30	148
110	144	161	184	155	87	164	122	114	143

(i) ඉහත අමු දත්ත ඇසුරෙන් ආවලියක් පිළියෙල කරන්න

(ලකුණු 03)

(ii) ඉහත අමු දත්ත හා ආවලිය ඇසුරෙන් අසමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් පිළියෙල කරන්න

(ලකුණු 03)

(iii) ඉහත (ii) ඇසුරෙන් 30-49, 50-69, 70-89,....... ආදී වශයෙන් පන්ති ප්‍රාන්තර පිළියෙල කර සමූහික සංඛ්‍යාත ව්‍යාප්තියක් පිළියෙල කරන්න

(ලකුණු 04)

(iv) තාත්වික සීමා හාවිතා කර ජාල රේඛයක් පිළියෙල කරන්න

(ලකුණු 05)

(V) ජාල රේඛය ඇසුරෙන් සංඛ්‍යාත බහුඅස්‍රය පිළියෙල කරන්න

(ලකුණු 05)

04.

පැයක වැටුප්	සේවකයන් ගණන
0-100	5
100-200	8
200-300	10
300-400	14
400-500	11
500-600	6
600-700	3

ඉහත වගුව හාවිතා කර,

(i) රේඛා ප්‍රස්තාරයක්

(ලකුණු 05)

(ii) බහු ගුණ ස්තම්භ ප්‍රස්තාරයක්

(ලකුණු 05)

(iii) සංරචක ස්තම්භ ප්‍රස්තාරයක්

(ලකුණු 05)

(iv) ප්‍රතිශත සංරචක ස්තම්භ ප්‍රස්තාරයක් අඳින්න

(ලකුණු 05)

05. (අ) සම්මත ප්‍රමත ව්‍යාප්ති වක්‍රයට පහළින්

(i) Z = 1.54 ට දකුණු පසින්
(ii) Z = 1.79 ට වම් පසින්
(iii) Z = -0.89 ට දකුණු පසින්
(iv) Z = -1.44 ට වම් පසින්
(v) Z = -1.68 ත් Z = 1.58 ත් අතර පිහිටන වර්ගඵලයන් සොයන්න

(ලකුණු 01x05)

(ආ) පාරිභෝගික ගිණුම් ආශ්‍රිතව සිදුකල තොරතුරු රැස් කිරීමක දී සාමාන්‍ය (average balance) ඉතිරුම් රු. 1200/= ක් ද එම ගිණුම් වල සම්මත අපගමනය රු. 400 ක් ද ලෙස සොයාගෙන ඇත. මෙම ගිණුම් වල ඉතිරුම් ප්‍රමත ලෙස ව්‍යාප්ත වී ඇතැයි උපකල්පනය කරන්න. ගිණුම් හිමියෙක් තෝරා ගැනීමේදී

(i) රු. 1500 ට වඩා වැඩි අයෙක්

(ලකුණු 04)

(ii) රු. 1000 ත් රු.1500 අතර ගිණුම් හිමියෙක්

(ලකුණු 04)

(iii) රු. 600 ත් රු. 900 ත් අතර ගිණුම් හිමියෙක් වීමේ ප්‍රතිශත සොයන්න. ඉහත තොරතුරු ප්‍රමත ව්‍යාප්තියක පිහිටන ආකාරය ඇඳ දක්වන්න

(ලකුණු 07)

06. (අ) පහත දැක්වෙන සහ සම්බන්ධතාවන් දළ රූප සටහන් ඇඳ කෙටියෙන් විස්තර කරන්න

(i) $r=+1$ හා $r=-1$

(ලකුණු 03)

(ii) $0.7<r<1$ හා $-1<r<-0.7$

(ලකුණු 03)

(iii) $0.3<r<0.7$ හා $-0.7<r<-0.3$

(ලකුණු 03)

(iv) $r=0$

(ලකුණු 03)

(ආ) වගාවක් සඳහා යොදා ගන්නා පොහොර ප්‍රමාණය සහ එමඟින් ලබා ගන්නා අස්වැන්න අතර තොරතුරු පහත වගුව මඟින් ලබාදෙයි.

පොහොර (ටොන්)	15	18	20	24	30	35	40	50
අස්වැන්න (ටොන්)	85	93	95	105	120	135	150	160

අස්වැන්න හා යොදාගන්නා පොහොර ප්‍රමාණය අතර ඇති සහ සම්බන්ධතාවය සොයන්න

(ලකුණු 08)

07. කර්මාන්ත ශාලාවක සේවකයන් සේවා මුර තුනක් සඳහා යොදවා ඇත. ඔවුන් විසින් සිදු කරන නිෂ්පාදනවල තත්වය පරීක්ෂා කිරීමේදී පහත දැක්වෙන තොරතුරු අනාවරණය කරගෙන ඇත.

තත්වය / සේවා මුරය	හොඳ	නරක
උදෑසන	900	130
සවස	700	170
රාත්‍රී	400	200

සේවා මුරය හා නිෂ්පාදනවල තත්වය අතර ඇති සහ සම්බන්ධතාවය සොයන්න. (95% වෙසෙසියා මට්ටමේදී පරීක්ෂාව සිදු කරන්න)

(ලකුණු 20)

****

සංඛ්‍යානය සමීකරණ,

01. මාතය = $L_l + \left(\frac{\Delta_1}{\Delta_1+\Delta_2}\right) C$

02. මධ්‍යනා = $A + \frac{\sum fd}{\sum f}$

03. මධ්‍යස්ථය = $L_l + \left[\frac{\frac{n}{2} - (\sum f)_l}{f_m}\right] c$

04. සම්මත අපගමනය = $\sqrt{\frac{\sum fd^2}{\sum f} - \left(\frac{\sum fd}{\sum f}\right)^2}$

05. කුටිකතා මිනුම = $\frac{\text{මධ්‍යනාය - මාතය}}{\text{සම්මත අපගමනය}}$

06. කුටිකතා මිනුම = $\frac{3\,(\text{මධ්‍යනාය - මධ්‍යස්ථය})}{\text{සම්මත අපගමනය}}$

07. සහ සම්බන්ධතා සංගුණකය = $\frac{\sum(x-\bar{x})(y-\bar{y})}{\sqrt{\sum(x-\bar{x})^2 \sum(y-\bar{y})^2}}$

08. කයි වර්ග පරීක්ෂාව = $\frac{\sum(o_i-e_i)^2}{\sum e_i}$

09. සුචලන අංකය = $(r-1)(c-1)$

සම්මත ප්‍රමත වක්‍රයට යට වර්ගඵලය

Standard Normal Distribution

$$z = \frac{x - \bar{x}}{\sigma}$$

Z	0	1	2	3	4	5	6	7	8	9
0.0	0.0000	0.0040	0.0080	0.0120	0.0160	0.0199	0.0239	0.0279	0.0319	0.0359
0.1	0.0398	0.0438	0.0478	0.0157	0.0557	0.0596	0.0639	0.0675	0.0714	0.0754
0.2	0.0793	0.0832	0.0871	0.0910	0.0948	0.0987	0.1026	0.1064	0.1103	0.1141
0.3	0.1179	0.1217	0.1255	0.1293	1.1313	0.1368	0.1406	0.1443	0.1480	0.1517
0.4	0.1554	0.1591	0.1628	0.1664	0.1700	0.1736	0.1772	0.1808	0.1844	0.1879
0.5	0.1915	0.1950	0.1985	0.2019	0.2054	0.2088	0.2123	0.2157	0.2190	0.2224
0.6	0.2258	0.2291	0.2324	0.2357	0.2389	0.2422	0.2454	0.2486	0.2518	0.2549
0.7	0.2580	0.2612	0.2642	0.2673	0.204	0.2734	0.2764	0.2794	0.2823	0.2852
0.8	0.2881	0.2910	0.2939	0.2967	0.2996	0.3023	0.3051	0.3078	0.3106	0.3133
0.9	0.3159	0.3186	0.3212	0.3238	0.3264	0.3289	0.3315	0.3340	0.3365	0.3389
1.0	0.3413	0.3438	0.3461	0.3485	0.3508	0.3531	0.3554	0.3577	0.3599	0.3621
1.1	0.3643	0.3665	0.3686	0.3708	0.3729	0.3749	0.3770	0.3790	0.3810	0.3830
1.2	0.3849	0.3869	0.3888	0.3907	0.3925	0.3944	0.3962	0.3980	0.3997	0.4015
1.3	0.4032	0.4049	0.4066	0.4082	0.4099	0.4115	0.4131	0.4147	0.4162	0.4177
1.4	0.4192	0.4207	0.4222	0.4236	0.4251	0.4265	0.4279	0.4292	0.4306	0.4319
1.5	0.4332	0.4345	0.4357	0.4370	0.4382	0.4394	0.4406	0.4418	0.4429	0.4441
1.6	0.4452	0.4463	0.4473	0.4484	0.4495	0.4505	0.4515	0.4525	0.4535	0.4545
1.7	0.4554	0.4564	0.4573	0.4582	0.4591	0.4599	0.4608	0.4616	0.4625	0.4633
1.8	0.4641	0.4649	0.4656	0.4664	0.4671	0.4678	0.4686	0.4693	0.4699	0.4706
1.9	0.4713	0.4719	0.4726	0.4732	0.4738	0.4744	0.4750	0.4756	0.4761	0.4767
2.0	0.4772	0.4778	0.4783	0.4788	0.4793	0.4798	0.4803	0.4808	0.4812	0.4817
2.1	0.4821	0.4826	0.4830	0.4834	0.4838	0.4842	0.4846	0.4850	0.4854	0.4857
2.2	0.4861	0.4864	0.4868	0.4871	0.4875	0.4878	0.4881	0.4884	0.4887	0.4890
2.3	0.4893	0.4896	0.4898	0.4901	0.4904	0.4906	0.4909	0.4911	0.4913	0.4916
2.4	0.4918	0.4920	0.4922	0.4925	0.4927	0.4929	0.4931	0.4932	0.4934	0.4936
2.5	0.4938	0.4940	0.4941	0.4943	0.4945	0.4946	0.4948	0.4949	0.4951	0.4952
2.6	0.4953	0.4955	0.4956	0.4957	0.4959	0.4960	0.4961	0.4962	0.4963	0.4964
2.7	0.4965	0.4966	0.4967	0.4968	0.4969	0.4970	0.4971	0.4972	0.4973	0.4974
2.8	0.4974	0.4975	0.4976	0.4977	0.4977	0.4978	0.4979	0.4979	0.4980	0.4981
2.9	0.4981	0.4982	0.4982	0.4983	0.4984	0.4984	0.4985	0.4985	0.4986	0.4986
3.0	0.4987	0.4987	0.4987	0.4988	0.4988	0.4989	0.4989	0.4989	0.4990	0.4990

අගයයන්

χ^2 ව්‍යාප්තිය (distribution)

d.f	x^2 0.5	x^2 025	x^2.01	x^2.005	d.f.
1	3.841	5.024	6.635	7.879	1
2	5.991	7.378	9.210	10.597	2
3	7.815	9.348	11.345	12.838	3
4	9.488	11.143	13.277	14.860	4
5	11.070	12.832	15.086	16.750	5
6	12.592	14.449	16.812	18.548	6
7	14.067	16.013	18.475	20.278	7
8	15.507	17.535	20.090	21.955	8
9	16.919	19.023	21.666	23.589	9
10	18.307	20.483	23.209	25.188	10
11	19.675	21.920	24.725	26.757	11
12	21.026	23.337	26.217	28.300	12
13	22.362	24.736	27.68	29.819	13
14	23.685	26.119	29.141	31.319	14
15	24.996	27.488	30.578	32.801	15
16	26.296	28.845	32.000	34.267	16
17	27.587	30.191	33.409	35.718	17
18	28.869	31.526	34.805	37.156	18
19	30.144	32.852	36.191	38.582	19
20	31.410	34.170	37.566	39.997	20
21	32.671	35.479	38.932	41.401	21
22	33.924	36.781	40.289	42.796	22
23	35.172	38.076	41.638	44.181	23
24	36.415	39.364	42.980	45.558	24
25	37.652	40.646	44.314	46.928	25
26	38.885	41.923	45.642	48.290	26
27	40.113	43.194	46.963	49.645	27
28	41.337	44.461	48.278	50.993	28
29	42.557	45.722	49.588	52.336	29
30	43.773	46.979	50.892	53.672	30

(0)

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම වර්ෂය 2023/24

ප්‍රථම සෙමෙස්තරය

(පවත්වන ලද්දේ නොවැම්බර් 2023)

BLM 1134 - ලේඛකත්වය හා සන්නිවේදනය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02ක් වත් තෝරා ගෙන <u>ප්‍රශ්න 05කට පමණක්</u> පිළිතුරු සපයන්න.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න දහයකින් (10) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහළින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙළට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

1 කොටස

1. මානව සන්නිවේදනයේ සංවර්ධනය හා මානව ශිෂ්ටාචාරයේ සංවර්ධනය අතර ඇති සම්බන්ධය ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

(ලකුණු 20)

2. සිංහල භාෂාව හා සන්නිවේදනය කෙරේ භාෂා ද්විරූපතාව බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

3. ගුවන් විදුලි මාධ්‍යයේ විශේෂතා පැහැදිලි කොට ගුවන් විදුලියට ලිවීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම සනිදර්ශනව විමසන්න.

(ලකුණු 20)

4. ප්‍රවෘත්ති රචනය පිළිබඳ 'යටිකුරු පිරමිඩ ආකෘතිය' ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රවෘත්ති වාර්තාව විවරණය කොට සුදුසු සිරස්තලයක් ද යොදන්න.

චීනයේ චෙංදූ නගරයේ ලබන 28 වැනිදා සිට අගෝස්තු 8 වැනිදා දක්වා පැවැත්වෙන 31 වැනි ලෝක විශ්වවිද්‍යාල සිසුන්ගේ ගිම්හාන ක්‍රීඩා උළෙලේ ක්‍රීඩා ගම්මානය විවෘත කෙරේ.

ජූලි 22 වැනිදා පෙරවරුවේ එහි නිල උත්සවය පැවැත්විණ. විවිධ රටවලින් පැමිණෙන විශ්වවිද්‍යාල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉහළින් පිළිගැනීම සඳහා පවතින අංගසම්පූර්ණ සූදානම එහිදී පිළිබිඹු කෙරිණ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් ක්‍රීඩකයන් පිරිසක් ද ඊට සහභාගි වීමට නියමිත ය.

චීන ජනාධිපති ෂී ජින් පිං, ලබන 27, 28 යන දෙදින ලෝක විශ්වවිද්‍යාල සිසුන්ගේ 31 වැනි ක්‍රීඩා උළෙලේ සමාරම්භක උත්සවයට එක්වීමට නියමිතය. එම උළෙලට වෙනත් රටවල රාජ්‍ය නායකයන් පිරිසක් ද එක්වනු ඇත.

(දිනමිණ 2023 ජූලි 24)

(ලකුණු 20)

5. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ ව සටහන් ලියන්න.

(අ) පුද්ගලාන්තර සන්නිවේදනය
(ආ) සන්නිවේදන ක්‍රියාවලිය
(ඇ) ලේඛන යුගය
(ඈ) පුවත්පත් බස් වහර

(ලකුණු 20)

II කොටස

6. සිංහල හෝඩිය වෙනස් කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(ලකුණු 20)

7. (අ) 'රීත්‍යානුකූල අක්ෂර වින්‍යාසය' යනු කුමක් ද? නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ආ) සිංහල ලේඛන ව්‍යවහාරයේ 'පොදු වැරදි' 10ක් දක්වා ඒවායේ නිවැරදි යෙදුම් දක්වන්න.

(ලකුණු 20)

8. සිංහල ලේඛන ප්‍රභේද පිළිබඳ වර්ගීකරණයක් ඉදිරිපත් කොට එයින් <u>එක් ප්‍රභේදයක්</u> පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 20)

9. ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්විය යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

10. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> පිළිබඳ ව සටහන් ලියන්න.

(අ) න - ණ - ල - ළ භේදය

(ආ) මිශ්‍ර සිංහල හෝඩිය

(ඇ) පාරිභාෂික පද

(ඈ) උද්ධෘත වර්ග

(ලකුණු 20)

039

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2023/24

ප්‍රථම සෙමෙස්තරය

පවත්වන ලද්දේ නොවැම්බර් 2023

BLM 1135 - මූල්‍ය ගිණුම්කරණය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරක් (04) සඳහා පමණක් පිළිතුරු සපයන්න.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05 සහ පිටු දහයකින් (10) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහළින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙළට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

1. අමල්කා නිෂ්පාදිතයින්ගේ ගිණුම් පොත්වලින් 2023.03.31 දිනට සාරාංශ කරගනු ලැබූ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ප්‍රාග්ධන ගිණුම		625,000
2022.04.01 දිනට තොග - අමුද්‍රව්‍ය තොග	30,000	
නොනිමි තොග	20,000	
නිමි තොග	28,000	
අමු ද්‍රව්‍ය ගැණුම්	705,000	
ගෙන ඒමේ කුලී	7,500	
වරිපනම් හා අය බදු	13,500	
දුන් වට්ටම්	1,050	
රක්ෂණ වාරිකය	2,400	
යන්ත්‍ර සූත්‍ර (නිෂ්පාදන අංශයේ)	408,000	
විකුණුම්		1,426,250
ණය ගැතියෝ / ණය හිමියෝ	58,900	32,000
බොල් ණය සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම		1,800
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	8,400	
විවිධ වියදම්	14,500	
ප්‍රචාරණ වියදම්	38,000	
නොමිලේ ලබාදුන් සාම්පල්	6,800	
කාර්යාල සේවක වේතන	64,000	
නිෂ්පාදන වේතන	72,500	
පුරස්කාර ගෙවීම්	12,000	
ඉන්ධන සහ විදුලිබලය	56,000	
කර්මාන්තශාලා සුපරීක්ෂණ වියදම්	24,000	
බෙදාහැරීමේ වාහන	610,000	
කාර්යාල උපකරණ	250,000	
15% දිගුකාලීන බැංකු ණය		150,000
ණය පොලී ගිණුම	15,000	
මිශ්‍ර ආදායම්		2,600
ජල සැපයුම් වියදම්	7,800	
අයිතිකරුගේ ගැණිලි	18,000	
2022.04.01 දිනට ක්ෂය සඳහා වෙන්කිරීම		
යන්ත්‍ර සූත්‍ර		85,000
කාර්යාල උපකරණ		54,000
බෙදාහැරීමේ වාහන		136,000
අත ඉතිරි මුදල් සහ බැංකු	43,500	
විකුණුම් ආපසු එවුම්	3,400	
ගැණුම් ආපසු යැවුම්		5,600
	2,518,250	**2,518,250**

අතිරේක තොරතුරු:

(i) 2023.03.31 දිනට පැවති අවසාන තොග පහත පරිදි ගණන් බලා ඇත.

-අමු ද්‍රව්‍ය තොගය	රු.27,200
-නොනිමි තොගය	රු.24,600
-නිමි තොගය	රු.21,800

(ii) ගෙන ඒමේ කුලී රු 2,100/- ගෙවිය යුතුව ඇත.

(iii) රු.35,700/- ක ණයට විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් ගතවී නොතිබුණි.

(iv) 2023.03.31 දින රු.1,700/- ආපසු යැවුම් ගිණුම් ගතවී නොතිබුණි.

(v) ප්‍රචාරණ වියදම් රු. 2,800/- ගෙවිය යුතුව ඇත.

(vi) වර්ෂය තුළ මිලදී ගත් ඉන්ධන වලින් රු.1900/- වටිනා ඉන්ධන තොගයක් වර්ෂය අවසානයේ ඉතිරිව තිබුණි.

(vii) ගෙවා ඇති රක්ෂණ වාරිකයෙන් 1/4 ඉදිරි වර්ෂය සඳහා අදාළ වේ.

(viii) යන්ත්‍ර සූත්‍ර, කාර්යාල උපකරණ සහ බෙදාහැරීමේ වාහන සරල මාර්ග ක්‍රමය මත 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

(ix) අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය ණයගැතියන්ගෙන් 5% ක් ලෙස ගැලපිය යුතුය.

(x) ඉන්ධන සහ විදුලි සැපයුමෙන් 50% ක් ද, ජල සැපයුමෙන් 75%ක්ද කර්මාන්ත ශාලාව සඳහා අදාළ වේ.

ඉහත තොරතුරු ආශ්‍රයෙන්,

(i) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමල්කා ව්‍යාපාරයේ නිෂ්පාදන, වෙළෙඳ හා ලාභ ලාභ ප්‍රකාශයද,

(ii) 2023.03.31 දිනට අමල්කා ව්‍යාපාරයේ මූල්‍ය තත්ව ප්‍රකාශණයද පිළියෙල කරන්න

(ලකුණු 40)

2. (අ) අමල්කා ව්‍යාපාරයේ 2023.03.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය තුළ සිදුවූ ගණුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණ ආකාරයෙන් පහත පරිදි සාරාංශ කොට ඇත.

ගණුදෙනුව	වත්කම්				වගකීම්		හිමිකම
	මුදල්	තොග	ණයගැති	දේපල	වෙළඳණය	බැංකු	
1	-50	+150			+100		
2	-200			+200			
3	+400	-250					+150
4	-150					-130	-20
5		-80	+120				+40
6	-60				-70		+10
7	+45		-50				-5
8		+50					+50
9		-10					-10
10	+80			-100			-20

ඉහත 1 සිට 10 දක්වා ඇති වටිනාකම්වලට අදාළ ගණුදෙනුව ලියා දක්වන්න.

(ලකුණු 10)

(ආ) ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමට පෙර අමල්කා ව්‍යාපාරයේ ගිණුම් සහකරු විසින් පහත දැක්වෙන වැරදි ලෙජර් ගිණුම් තුළින් සොයා ගන්නා ලදී. එම ගණුදෙනු නිවැරදි කිරීම සඳහා සුදුසු ජ්නල් සටහන් ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

(i) වැටුප් ගෙවීම රු.7550/- වැටුප් ගිණුමේ රු.5750/- ලෙස ලියා තිබුණි. (මුදල් පොත නිවැරදිව ලියා තිබුණි)

(ii) විකුණුම් ජ්නලයේ එකතුව රු.1000/- අඩුවෙන් එකතු වී තිබුණි.

(iii) ලැබුණු පොලී රු.1200/- මුදල් පොතේ නිවැරදිව සඳහන් කර තිබුනත් එය ගෙවූ පොලී ගිණුමේද බැරට සටහන් කොට තිබුණි.

(iv) රු 12,500/- ක් වූ රථවාහන නඩත්තු වියදම රථ වාහන ගිණුමේ සටහන් කොට තිබුණි.

(v) ව්‍යාපාරික තොගයක් විනාශ වීම වෙනුවෙන් රක්ෂණ වන්දි ලෙස ලැබුන රු.3,600/- චෙක්පතක් අමල්කා සිය පෞද්ගලික බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි.

(vi) කපාහල බොල්ණය රු.1,600/- නැවත ලැබී තිබුණු අතර ඒ පිළිබඳව කිසිදු සටහනක් ලෙජර් ගිණුම් වල ලියා නොමැත.

(vii) ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය රු.2,800/- අමල්කා පෞද්ගලිකව ගෙවා තිබුණි.

(viii) වෙළඳ සහයකයෙක් රු.5,000/- වටිනා භාණ්ඩ තොගයක් රැගෙන පලාගොස් ඇති අතර ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් මේ දක්වා ලැබී නොමැත.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3. (අ) අමල්කගේ ව්‍යාපාරික බැංකු ගිණුමෙ සහ මුදල්පොතේ බැංකු තීරුවේ සාරාංශයක් 2023.10.31 දිනට පහත පරිදි සාරාංශ කොට ඇත.

බැංකු ගිණුම් විස්තරය

දිනය	ගණුදෙනුව	හර (රු)	බැර (රු)	ශේෂය (රු)
23/10/01	ශේෂය			11,500
10/04	චෙක් තැන්පත් -මහේෂ්		750	12,250
10/07	චෙක් තැන්පත් - නිමල්		1,000	13,250
10/10	අමිල (0316)	850		12,400
10/15	මුදල් (0317)	2,400		10,000
10/20	චෙක් තැන්පත් (කමනි)		500	10,500
10/23	හර්ෂ (0318)	700		9,800
10/26	නිත්‍ය නියෝග (රක්ෂණ)	500		9,300
10/30	බැංකු ගාස්තු	50		9,250
10/30	පොලි ආදායම්		110	9,360
10/30	ආයෝජන ආදායම්		640	10,000

මුදල් පොත (බැංකු තීරුව)

දිනය	විස්තරය	මුදල	දිනය	විස්තරය	මුදල
10/01	ශේෂය	11,500	10/10	රමණි(0315)	900
10/01	මහේෂ්	750	10/12	අමිල (0316)	850
10/05	නිමල්	1,000	10/15	මුදල් (0317)	2,400
10/29	රොෂාන්	600	10/18	හර්ෂ(0318)	700
10/30	කුමාර	400	10/12	සුනිල්(0319)	440
			10/28	ආරිය කුමාර(0320)	660
			10/31	ශේෂය	8,300
		14,250			**14,250**

ඉහත තොරතුරු ආශ්‍රයෙන් මුදල් පොත (බැංකු තීරුව) නිවැරදි කොට 2023.10.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න

(ලකුණු 10)

(ආ) සීමිත පෙරේරා සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු.000)

විකුණුම්	9,000
දළ ලාභය	3,200
මෙහෙයුම් වියදම්	1,200
පොලී වියදම්	2,000
වර්ෂය සඳහා ආදායම් බදු	450
සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ	300

2023.03.31 දිනට

තොගය	1,100
වෙළෙඳ ණය ගැතියෝ	1,400
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සා.කොටස් 150,000)	3,000

අතිරේක තොරතුරු:

(i) සියලු වියදම් ණය පදනම මත සිදු කෙරේ.

(ii) 2022-04-01 දිනට තොගය රු.900,000/- විය.

(iii)2022-04-01 දිනට වෙළඳ ණය ගැතියෝ රු.1,600,000/-

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කරන්න.

(i) දළ ලාභ අනුපාතය
(ii) ශුද්ධ ලාභ අනුපාතය
(iii) තොග පිරිවැටුම් අනුපාතය
(iv) ණය ගැති පිරිවැටුම
(v) කොටසක ඉපැයුම
(vi) කොටසක ලාභාංශය

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

4. (අ) සුහද ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 125ක් සිටින අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු.100/- කි. 2023-03-31 දිනට භාණ්ඩාගාරික විසින් පිළියෙළ කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

	රු.		රු.
2022-04-01 බැංකු ශේෂය	14,600	ආපනශාලා සැපයුම්කරුවන් සඳහා ගෙවීම	10,600
සාමාජික ගාස්තු ලැබීම්	13,500	තරග වියදම්	2,100
ප්‍රභූවරුන්ගෙන් ලද ආධාර මුදල්	12,500	ක්‍රීඩා උපකරණ ගැනුම්	8,600
ලැබූ බැංකු පොලී	1,400	පොදු වියදම්	12,200

ආපනශාලා විකුණුම්	18,300	සාමාජික සුභසාධන වියදම්	1,380
තරඟ නැරඹීමේ ගාස්තු/ ආදායම්	5,100	කාර්ය මණ්ඩල වේතන	7,500
		ආපදා සහන ගෙවීම්	2,700
		31-03-2023 ශේෂය	20,320
	65,400		**65,400**

වෙනත් තොරතුරු පහත දැක්වේ.

(i) ක්‍රීඩා සංගමයේ වත්කම් හා වගකීම්

	2022.04.01	2023.03.31
ක්‍රීඩා උපකරණ	48,500	52,000
ආපනශාලා තොගය	7,250	4,600
ආපනශාලා ණයගැතියෝ	3,600	4,550
ආපනශාලා සැපයුම් සඳහා ණයහිමියෝ	1,750	2,100
උපචිත පොදු වියදම්	4,000	3,200
ස්ථාවර තැන්පත්	47,250	47,250
ලැබිය යුතු සාමාජික මුදල්	2,000	??

(ii) සාමාජික මුදල් වලින් රු.1500/- කලින් වර්ෂය (පසුගිය වර්ෂය) සඳහා ලැබුන අතර, ඉදිරි වර්ෂය සඳහා ලැබී ඇති සාමාජික මුදල රු.1000/- කි.

(iii) ලියාපදිංචි ගාස්තු ලෙස වාර්ෂිකව රු.2000/- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවිය යුතුය. මෙම වර්ෂය සඳහා එම මුදල තවම ගෙවා නොමැත.

(iv) පොදු වියදම් වලින් 10% ආපනශාලාව සඳහා අදාළ වේ.

ඉහත තොරතුරු ආශ්‍රයෙන්

(i) 2022-03-31 අවසන් වර්ෂය සඳහා ආපනශාලා වෙළඳ හා ලාභ/ ලාභ ගිණුම

(ii) 2023-03-31 අවසන් වර්ෂය සඳහා සුහද ක්‍රීඩා සමාජයේ අදායම් වියදම් ගිණුම

(iii) 2023.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

(ලකුණු 15)

(ආ) පහත දැක්වෙන තොරතුරු සීමිත රුවන් සමාගමෙන් උපුටාගෙන ඇත.

(i) 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ ලාභ ගිණුමෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

(රු.000)

දල ලාභය	5,600
දේපල විකුණුම් මත ලාභ	700
මෙහෙයුම් වියදම්	(800)
වත්කම් ක්ෂය වීම	(1,200)
ණයකර පොලිය	(1,300)
බදු පෙර ලාභය	**3,000**

(ii) ජංගම වත්කම් සහ ජංගම වගකීම්වල වෙනස්වීම

	2023.03.31 (රු,000)	2022.03.31 (රු,000)
ඉතිරි තොග	2,000	3,000
ණයගැතියෝ	9,000	8,000
මුදල් හා බැංකු	2,000	1,900
ණයහිමියෝ	6,000	4,000
උපචිත වියදම්	4,000	3,000

2023.03.31 අවසන් වර්ෂය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ප්‍රවාහය ගණනය බලන්න

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

5.කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) 1890 හවුල් ව්‍යාපාර පනතේ 24 වගන්තියේ සඳහන් කොන්දේසි

(ii) ඕනෑම ගිණුම්කරණ සංකල්ප දෙකක් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති දෙකක්

(iii) මූල්‍ය ප්‍රකාශන තුළ පවත්වා ගත යුතු ගුණාත්මක ලක්ෂණ

(iv) සමාගම වාර්ෂික වාර්තාවක් තුලින් ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රධාන මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු.

(එක කොටසකට ලකුණු 05)
(මුළු ලකුණු 20)

****